# අමා ගඟුල

කලාප අංක 209

ශ්‍රී. බු. ව. 2568 ක් වූ ඉල් මස කලාපය, ර‍ා. ව. 2024 ක් වූ නොවැම්බර් මස 15 වන දින

වැලිගම, ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති
**ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

## "සත්‍ය නොපෙනෙනතුරු දුක සැපක් ලෙස දකී"

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

**"කතමඤච භිකඛවෙ උපාදානං ? චතතාරිමානි භිකඛවෙ, උපාදානානිඃ කාමූපාදානං දිට්ඨූපාදානං සීලබබතූපාදානං අතතවාදූපාදානං. ඉදං වුචචති භිකඛවෙ උපාදානං."**

**" මහණෙනි, උපාදාන කවරේද? මහණෙනි, කාම උපාදානය, දිට්ඨිඋපාදානය සීලබ්බතඋපාදානය, අත්තවාද උපාදානයයි මේ උපාදාන සතරෙකි. මහණෙනි මේ උපාදානයයි කියනු ලැබේ. "**
**(සංයුක්ත නිකාය -විභඞ්ග සූත්‍රය)**

**ධර්මකාමී පින්වතුනි,**

**අද ඉල් මස පුර පසළොස්වක පොහොයයි. ප්‍රථම ධම් දූත පිරිස ධම් ප්‍රචාරය ඇරඹීම, බුදුරජාණන් වහන්සේ තුන් බෑ ජටිල තාපස වරුන් දමනය කිරීමට උරුවෙල් දනව්වට වැඩීම, සැරියුත් මහ රහතන් වහන්සේ පිරිනිවන් පෑම , මෙත් බෝසතුන් වහන්සේ විවරණ ලැබීම, පසු වස් පවාරණය කිරීම සහ මෙම වසරේ කඨින චීවර පූජාව කළ හැකි අවසන් දිනය වීම වැනි විශේෂ සිදුවීම් සඳහා හේතු වන සහ හේතු වූ උතුම් දිනයකි. අද මෙම දහම් පණිවුඩයට මාතෘකා කරන ලද්දේ විභඞ්ග සූත්‍රයට අයත් ගාථා ප්‍රදේශයකි. මෙම සූත්‍ර දේශනාව භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවසන දිනක පටිච්ච සමුප්පාද දේශනාව බෙදා දක්වමින් සසර නැවැත්ම සහ පැවැත්ම දැක්වීමට වදාළ සේක. හේතු ඵල දහම යනුවෙන් ද හඳුන්වන්නේ එයමයි. සැරියුත් මහ රහතන් වහන්සේ ගිහිව සිට අස්සජී මහ රහතන් වහන්සේ මුලින් ම මුණගැසුණු අවස්ථාවේ බුදු හිමියන්ගේ ශාසන ධර්මය කෙබඳුදැයි දැනගැනීමට විමසූ විට ඉතා කෙටියෙන් පැවසුවේ,**

**" යෙ ධමමා හෙතුපපභවා - තෙසං හෙතුං තථාගතො ආහ,**

තෙසඤ්ච යො නිරොධො - එවං වාදී මහාසමණො ”

“ හේතූන් නිසා ඇතිවන යම් ඵලයක් වේද එම ඵල ධර්මයන්ගේ හේතූන් ද තථාගතයන් වහන්සේ වදාළ සේක. එකී හේතු ධර්මයන්ගේ වැළැක්ම ( = නිරෝධය ) ද එම හේතු නිරෝධයෙන් ඇතිවන්නා වූ ඵල නිරෝධය ද වදාළ සේක. මහා ශ්‍රමණ වූ බුදුරජාණන් වහන්සේ මෙසේ වූ දේශනාවක් ඇති සේක.”

තෙරුවන් සරණ ගිය ගිහි පැවිදි අප කාගේත් අරමුණ නිවන් දැකීම හෙවත් සසර දුකින් නිදහස් වීමය. අපේ ශාස්තෘන් වහන්සේ අවබෝධ කරගත්තේ බාහිර දෙවියෙකුගෙන් හෝ ගුරුවරයෙකුගෙන් ලබාගත් දහමක් නොවේ. තමන් වහන්සේගේ උත්සාහයෙන් යෝනිසෝමනසිකාරයෙන් උපදවා ගත් ඥානයකි. ඒ අසිරිමත් ප්‍රඥා මහිමය කුමක් දැයි අපිට තේරුම් ගත හැකි වන්නේ ශ්‍රී සද්ධර්මය තුළින් මය. අද මෙම දහම් පණිවුඩයෙන් අපේක්ෂා කරන්නේ බෞද්ධයාගේ පරම අභිලාශය වූ නිවන් සැප උදාකර ගැනීම සඳහා හේතුවන බණ පදයක් විමසීමට ය.

අප ඇතුළු උපන් සත්වයා කවදා නමුත් ඒකාන්තයෙන් ම මිය යන්නේ මය. එය වැළැක්විය හැකි කෙනෙකු ලොවේ නැත. ගැටළුව එයම නොවේ. නැවත නැවත ඉපදී දුකට පත්වෙමින් නැවත නැවත මිය යන්නට සිදුවීමය. සියළු ලෝ සතුන් ගේ මේ අද්භූත සංසාර චක්‍රය උන්වහන්සේට අවබෝධ වූයේ සර්වඥතා ඥානයට අන්තර්ගත වූ “ චුතූපපාත ඥාණය” (චුති උප්පති දකින නුවණ) නම් වූ මානසික ශක්තිය තුළින් ය. එසේ නොවන්න සංසාරගත අසරණ වූ අපිට සද්ධර්මය නම් වූ ඒ අමෘත වචනය ඇසීමටවත් නොලැබෙනු ඇත. ශ්‍රී සද්ධර්මය තේරුම් ගැනීමට අවබෝධය පිණිස තමාගේ සිත හැසිරවීමේ හැකියාව නම් වූ “යෝනිසෝ මනසිකාරය” අවශ්‍ය වේ. මේ හැකියාව ඇති තැනැත්තා ව්‍යඤ්ජනයේ රස හඳුනාගන්නා දිවක් මෙනි.

ඇතැමුන් සිතන්නේ දිව්‍ය සම්පත් විඳින දෙවියන්ට ජරා, මරණා දී දුක් නැත යනුවෙනි. දිව්‍ය ආයුෂ කල්පයක් තරම් තිබුණත් දේවත්වයේ උපන් දා සිට ඒ දිව්‍ය ආයුෂ ගෙවී අවසන් වන බව දහමෙහි දැක්වේ. දීඝනිකාය සක්කපඤ්හ සූත්‍රයට අනුව එක් අවස්ථාවක සක් දෙවිඳු බුදුරජාණන් වහන්සේ වෙත ගොස් බණ අසා ඒ දෙසුම අවසන් වන විට සෝවාන් ශ්‍රාවකයකු බවට පත්විය. ඒ සමගම ඒ සක් දෙවියන්ගේ ආයුෂ අවසන් වී තිබුණි. එසේ ජරාවට පත් සම්මාදිට්ඨියට පැමිණි දෙවිඳු බුදුහිමි ඉදිරියේ ම මරණයට පත්ව එතැනදීම නැවත ශක්‍ර දේවත්වයෙන් ඕපපාතිකව ඉපදුනි. ඒ ගැන සතුටට පත්වූ දෙවිඳු බුදුරදුන්ට ගාථාවකින් මෙසේ පවසා ඇත.

“ඉධෙව තිට්ඨමානසස - දෙවභූතසස මෙ සතො,

පුනරායු ච මෙ ලද්ධො - එවං ජානාහි මාරිසා ”ති.

"නිදුකාණෙනි, දහමෙහි පිහිටා මෙහි සිටි මම ආයු ගෙවී මෙතැනදීම චුත වී නැවත දෙව් ව මෙතැනම ඉපදී ආයුෂ ලැබුණි."

ශක්‍ර දෙවියන් ද ජරා මරණ දුකට පත්වන බව මේ සූත්‍රයට අනුව තේරුම් ගනිමු. සම්මා දිට්ඨියට පැමිණ සිටි නිසා නැවත දිව්‍ය සම්පත් උරුම විය. නැතිනම් අපායා දී දුක්ඛිත උපතක් වීමට හැකිය. මාතෘකා ගාථාවෙහි දැක්වෙනුයේ "උපාදාන" යනු කුමක්දැයි පහදා දීමය. උපාදාන යන වචනයේ තේරුම බොහෝ විට අර්ථ දෙන්නේ අල්ලා ගැනීම, තදින් ග්‍රහණය කර ගැනීම වශයෙනි. එනමුත් කෙනෙකු විසින් කරන දෙයක් නොව හේතුවක් සහ ඵලයක් බැවින් පැහැදිලි අර්ථය වන්නේ දැඩිව හෝ සියුම් ලෙස බැඳී යාම, ග්‍රහණය වීම යන අර්ථයයි. අල්ලා ගැනීම යන වචනය උපාදාන කරන්නෙකු ගැන හැඟීමක් එන බැවින් උපාදානය යනු හටගන්නවා යැයි භාවිතා කිරීම සුදුසු බව මෝලියඵග්ගුන නම් සූත්‍රයට අනුව ද වදාරා ඇත.

මෙයින් අප උත්සාහ ගත යුත්තේ බුදු සමිඳුන් වදාළ හේතුඵල දහම අවබෝධ කරගැනීම සහ ඒ අනුව සංසාර ගමන තේරුම් ගැනීමය. උපාදානය හටගන්නේ තණ්හාව හේතු කරගෙන බැවින් " තණ්හා පච්චයා උපාදානං" යනුවෙන් වදාරා ඇත. එම හේතු ඵල න්‍යාය අනුවම බලමු උපාදාන හේතුවෙන් කුමක් හටගන්නේ ද? යන්න. "උපාදාන පච්චයා භවො" එනම් බැඳී යාම ග්‍රහණය වීම නිසා භවය සකස් වෙයි. "භවය" යන්නෙහි අර්ථය සාමාන්‍ය ව්‍යවහාරයේ " පැවැත්ම " ලෙසට භාවිතා වුව ද " විපාක විඳීමට කර්ම සකස් වීම" යන තේරුම ගත්විට " භව පච්චයා ජාති " භවය හේතු කොට ඉපදීම සිදුවේ යන්න තව දුරටත් තහවුරු වේ. මෙයින් පැහැදිලියි බැඳී යෑම නිසා විපාක පිණිස කම් රැස්වී උප්පත්තියට හේතු වන බව. අපේ ජීවිතයේ අභ්‍යන්තරිකව සකස්වන සංසාර ගමනෙහි ස්වභාවය එකවරට නොපෙනේ. එබැවින් බුදුරජාණන් වහන්සේ ක්‍රමවේදයක් වදාරා ඇත. එනම් , සීල, සමාධි, ප්‍රඥා වශයෙනි. භවය සකස් වන්නේ උපාදාන (ග්‍රහණය වීම = බැඳී යෑම) හේතුවෙන් නම් එසේ බැඳීම් 04ක් වදාරා ඇත. මාතෘකා ගාථාවට අනුව 1.කාම උපාදාන 2.දිට්ඨි උපාදාන 3.සීලබ්බත උපාදාන 4.අත්තවාද උපාදාන වශයෙනි. මේ සතර ආකාර වූ උපාදානයන් නිසා සකස් වන "කර්ම" විපාක දීම පිණිස සකස් වන භවය නිසා ඒ ඒ සත්වයෝ නිරය, ප්‍රේත, තිරිසන්, මිනිස්, දිව්‍ය ලෝකයන්හි උප්පත්තිය ලබති. මේ සියලු උප්පත්තීන් සිදුවන්නේ උපාදාන හේතු කරගෙනය. පළමු උපාදානය වූ කාමුපාදානය යනු කුමක්ද? අංගුත්තර නිකාය නිබ්බේධික සූත්‍රයට අනුව,

"සඞකපපරාගො - පුරිසසස කාමො , නෙතෙ කාමා යානි - චිත්‍රානි ලොකෙ,

සඞකපපරාගො - පුරිසසස කාමො , තිටඨනති චිත්‍රානි- තථෙව ලොකෙ

අථෙතථ ධීරා -විනයනති ඡනදනති."

" කාම ලෝකයේ උපන් සත්වයාගේ කාමය වන්නේ සංකල්පයට ඇලීමයි. ලොව තිබෙන යම් විචිත්‍ර දේ වේ නම් ඒවා කාමය නොවේ. සත්වයාගේ කාමය යනු සංකල්පයට ඇලීමයි. ලොව විසිතුරු දේ ඒ විදියට ම පවතී. ඒ අරමුණු කෙරේ උපන් කැමැත්තට නුවණැත්තෝ නොඇලෙති."

කාමය යනු කුමක්දැයි එයින් පැහැදිලිවේ. කාමය යනු කවර ආකාරයක දුකක් දැයි බුදු හිමියන් විවිධ ආකාරයෙන් පහදා ඇත. දිනක් සැවැත් නුවර පිඬු සිඟා වැඩි භික්ෂූන් වහන්සේලා යදමින් බැඳ රැගෙන යන සිරකරුවන් පිරිසක් දැක කම්පා සිතින් බුදු හිමියන්ට ඒ ගැන සැල කළහ. බුදු හිමියන් වදාළේ , "මහණෙනි, යදමින් බඳින ලද බන්ධනය දරුණු ලෙස නුවණැත්තන් නොදකිති. එහෙත් දූ දරු, ස්වාමි භාර්යා, රන් රිදී, මුතු මැණික් ආදී වස්තූන් කෙරෙහි අනවබෝධයෙන් යම් අපේක්ෂාවක් බැඳීමක් , යමෙකුට තිබේ නම් එය දරුණුම බන්ධනය වනු ඇත යනුවෙනි. එබැවින් බුදු හිමියන් පෙන්වා දෙනුයේ කාමයේ ආදීනව (දෝෂය) නිස්සරණය (නිදහස්වීම) ආශ්වාදය ( (රසවිඳීම) නුවණින් අවබෝධ කරගත යුතු බවයි. කාම ලෝකයේ උපදින සත්වයෝ කාම අරමුණුවල සිරවී සිටිති. එනම්, රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන්ටය. ඒවාට වසඟවීම නිසා සුලුවෙන් හෝ ප්‍රාණඝාත ආදී අපරාධ වලට පෙළඹී ඇත. මේ සඳහා ඉහත කී කාම ගුණ 05 මුල් වේ. මේ කාම උපාදානයයි. (කාමුපාදානං)

මීලඟ උපාදානය දිට්ඨිඋපාදානයයි. අපේ ජීවිත පැවැත්වීමේ දී නොයෙක් අදහස්, ආකල්ප, මතවාද අප අතර පවතී. ඒ ඒ මතවාදයන්ට අපි ග්‍රහණය වෙනව. "අරකත් හරි මේකත් හරි " කියමින් කටයුතු කරනව. බුදුහිමියන් පෙන්වා දෙන්නේ ලෝක සත්වයා සිටිනුයේ අන්ත දෙකක් තුළ ය. එනම් ශාස්වත සහ උච්ඡේද වශයෙන් ය. මරණින් පසු සදාකාලික බවට පත්වන ආත්මයක් තමා තුළ තිබේය යන අන්තය සහ සියල්ල නැත යන අන්තයයි. එනම් ජීවිතය පවතිනුයේ මරණය දක්වාය යන මතයයි. ජීවත්ව ඉන්නාතෙක් කාබී සියලු සැප මෙහිදී විඳිය යුතුය. යන අදහසයි. පිං පවු, පරලොව, යුතුකම් අනුමත නොකරයි. මේ ආකාර දෘෂ්ඨියකට බැඳී ගියවිට වචනයෙන් තෙරුවන් සරණ ගියත් බුදු හිමියන් වදාළ ධර්මය විනය තුළ ඔහු නැත. විවිධ විශ්වාස, අභිචාර විධීන් අනුගමනය කරයි. එවිට සිදුවන්නේ යහපත් ජීවිතයක් ප්‍රායෝගිකව ගොඩනගා ගැනීමේ අවස්ථාව බැහැර කොට අද්භූත විසඳුම් සොයා වෙහෙස වීම ය. දෘෂ්ඨි උපාදානය මොනතරම් භයානක දෙයක් දැයි අපට මෙයින් තේරුම් ගත හැකිය. දෘෂ්ඨි වලට බැඳී යාම නිසා ම විපාක විඳීමට කර්ම සකස් වේ.(දිට්ඨුපාදානං)

මීලඟට සීලබ්බත උපාදානයයි. මෙය තම තමන්ගේ යහපතට වාසියට උපකාර වනු ඇතැයි හැඟීමෙන් නිර්මාංශවීම,කිලිකුණුවලින් වැළකීම ආදී විවිධාකාර ශීලයන්ට වෘතයන්ට බැඳී යාමයි. එවැනි තත්වයන් තෙරුවන් සරණ ගිය බෞද්ධ නාමයෙන් පෙනී සිටින ඇතැමුන් ලඟ ද ඇත. ඒ බව ඔවුන් නොදන්නේ කරන්නන්වාලේ කරන නිසාය. මිත්‍යාවන් සීලයක් යැයි විශ්වාස කරන්නේ බුදුරජාණන් වහන්සේ වදාළ ශීලය හඳුනා නොගත් තැනැත්තන්ය. උන් වහන්සේ පෙන්වා වදාළේ කයින් සහ වචනයෙන් සිදුවන වැරදි වළක්වා ගැනීම ශීලය ලෙසටයි. එයින් සාමකාමී සහනශීලී ජීවිතයක් උදාකර ගැනීමයි. එහි අත්භූත අස්වාභාවික කිසිවක් නැත. එහි ඇත්තේ හුදෙක්ම ඉන්ද්‍රිය දමනයයි. ශාන්ත වූ සංවරයකි. මිථ්‍යා ශීල වෘත්තයන්ට මුළාවී අන්තයට බැඳී ගියවිට චේතනාත්මකව රැස් වන්නේ අවිද්‍යා සහගත කර්මයන් ය. සීලබ්බත උපාදානයෙන් ද විපාක විඳීමට කර්ම සකස් වේ.(සීලබබතුපාදානං)

මීලඟ උපාදානය අත්තවාද උපාදානයයි. එනම්, මම ය, මාගේ ය, මගේ ආත්මයයි අනවබෝධයෙන් සිතේ මුල් බැසගත් මතයට බැඳී යාමයි. මේ තුළින් බල පවතින්නේ තමා යැයි සැලකිය හැකි තමාට උවමනා හැටියට පැවැත්විය හැකි තමාගේ යැයි ප්‍රකාශ කළ හැකි යමක්, එනම් ස්ථිර වූ ආත්මයක් තම ජීවිතය තුළ පවතිනවාය යන අදහසය. ජීවිතය පුරා මේ ආත්ම සංකල්පය පවතිනුයේ ස්වභාවයෙන් ම සිතේ මවාගත් බැලූ බැලූ අත එයම සත්‍යයක් සේ පෙනෙන නිසාය.(අතතවාදූපාදානං)

මේ සතර ආකාරයේ උපාදානයන් තිබෙන කල්හි භවය හෙවත් විපාක විඳීමට කර්ම සකස්වීම සිදුවන්නේමය. හේතුඵල ධර්මතාවයේ ස්වභාවය හේතුව සකස්වනවිට ඵලය සකස් වීමය. හේතුව නිරුද්ධ වන විට ඵලය නිරුද්ධ වීමයි.බුද්ධ ශාසනයේ උත්තරීතර ප්‍රඥාව ලබාගත් රහතන් වහන්සේට මේ සතර ආකාර බැඳීයාම් සහ මුලින් ම ප්‍රහීන වී ඇත. උපාදාන නැති නිසා භවය ද නිරුද්ධ වී ඇත. භවය නිරුද්ධ වීම නිසා ඉපදීම ද නිරුද්ධ වී ඇත. උපතින් නිදහස් වූ විට ජරා මරණ දුකින් සදහටම නිදහස් වනු ඇත. තෙරුවන් සරණගත වූ අප ද දුකින් නිදහස් වූ රහතන් වහන්සේලා ආදර්ශ කරගෙන සසර දුකින් නිදහස් වීමට අද මෙම උතුම් පොහොය දිනයේ දී අධිෂ්ඨාන ඇති කරගෙන වීර්ය වඩමු.